## ශ්‍රී ලංකාවේ පැරණි පිරිවෙන් විශ්වවිද්‍යාල ක්‍රමය වර්තමානයට ජීවමාන කළ ශ්‍රේෂ්ඨ යතිවරයාණෝ

# අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරතාභිධාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආදි කර්තෘ නාහිමිපාණන් වහන්සේ

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා**
**පුරාවිද්‍යා අංශයේ හිටපු අංශ ප්‍රධානී හා**
**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ**
**මහාවංශ සම්පාදක මණ්ඩලයේ ලේකම්**
**සේවාසම්මානිත මහාචාර්ය මාලනී ඇඳගම මහත්මිය විසිනි**
**2015 ක් වූ ජූලි මස 17 වන දා**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අනුස්මරණ උත්සවය**

අප්‍රමාණ වූ සම්පත්වලින් පිරුණ පරක් තෙරක් ගැඹුරක් නොදැකිය හැකි මහා සයුරක් හා සමානයයි නොපැකිළව සඳහන් කළහැකි අප කථානායක මාහිමපාණන් වහන්සේ පිළිබඳ මෙම සමරු දෙසුමේ දී මට හිමිවී ඇති විශේෂ වාසියක් තිබේ. එනම් අප කථානායක මාහිමිපාණන් වහන්සේ වූ අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරතාභිධාන මාහිමිපාණන් වහන්සේගේ උපත, පැවිදිවීම, මූලික අධ්‍යාපනය, උපසම්පදාව ලබා ගැනීම,විද්‍යෝදය පිරිවෙනට ඇතුල්වීම, එහි ගුරු මණ්ඩලයට බඳවා ගැනීම, එහි පරිවෙනාධිපති තනතුරට පත්වීම සහ ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමෙන් පසුව එහි ප්‍රථම උපකුලපති තනතුරට පත්වීම මෙන්ම උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවය, පාණ්ඩිත්‍යය, ග්‍රන්ථකරණය පමණක් නොව ශික්ෂාකාමී ගුණ ගරුක ඇවතුම් පැවතුම් වැනි අතිවිශේෂ ගුණාංගවලින් පිරි ජීවිත කථාව පිළිබඳ බොහෝ තොරතුරු පසුගිය වසර කිහිපයක් තිස්සේ පවත්වන ලද සමරු දේශනවල මෙන්ම සම්මාන උපහාර පිදීම ආදී අවස්ථා මුල්කොට ගත් විවිධ ප්‍රකාශනවල බෙහෙවින් සඳහන් වී තිබීමය. එහෙත් ඒ උදාර උත්තම චරිතය පිළිබඳ ලියා හෝ කියා අවසන් කිරීම අතිශය දුෂ්කර කාර්යකි. මන්ද යත් අද වැනි කාලයකට අප්‍රමාණ වැදගත්කමකින් යුක්ත උන්වහන්සේගේ දර්ශන, මතවාද, චින්තනයන් මෙන්ම සම්ප්‍රදායන් ද එපමණටම අති විශාල වන බැවිනි.

එබැවින් මගේ මේ දේශනයේ දී යම් පමණකට සම්ප්‍රදායානුකූල සමරු දේශන පිළිවෙතින් බැහැරව නිරන්තරයෙන් කියවෙන දේ අතහැර සෝරත නා හිමිපාණන් වහන්සේ ගේ ජීවිතයේ විශේෂ අංගයක් බවට පත් කර ගෙන තිබූ පිරිවෙන් අධ්‍යාපනය සහ විශේෂයෙන් මෙරට පැවති පැරණි මෙන්ම නූතන පිරිවෙන් විශ්ව විද්‍යාල අධ්‍යාපනය පිළිබඳව ඓතිහාසික විග්‍රහයක් සමඟ එහිලා

උන්වහන්සේ විසින් ඉටු කරන ලද අප්‍රමාණ සේවය පිළිබඳව පැහැදිලි කිරීමක යෙදෙන්නට අදහස් කරමි.

එම ඓතිහාසික තොරතුරු පිළිබඳව මෙහි රැස්ව සිටින වැඩි දෙනෙකුට යථාවබෝධයක් ඇතිවාට සැකයක් නැත. එහෙත් වර්තමාන පාසල් ශිෂ්‍ය පරපුරට මෙන්ම විශ්ව විද්‍යාල සිසුන්ට සහ තරුණ පරම්පරාව ඇතුළු බොහෝ අයට මෙම ඓතිහාසික කරුණු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා දීමේ ක්‍රමවේදයක් නොතිබුන බව සැඟවිය නොහැකිය. ඕනෑම රටක ජාතික අනන්‍යතාවයෙහි ඇති වටිනාකම එය ගොඩනැගෙන ආකාරය සහ එය සුරක්ෂිත කරගතහැකි ආකාරය පිළිබඳව අනාගත පරපුර දැනුවත් කිරීම විද්වතුන්ගේ වගකීම වන බව අමුතුවෙන් කිවයුතු නොවේ. ඒ සඳහා ක්‍රියාත්මක වීමට විද්වතුන් දිරි ගැන්වීම අතීතයේ විශ්ව කීර්තියට පත්ව තිබූ පිරිවෙන් විශ්වවිද්‍යාල බලධාරීන් විසින් කටයුතු සිදු කරන ලද ආකාරයටම වර්තමානයේ අපේ පිරිවෙන් විශ්ව විද්‍යාලවල බලධාරීන් විසින් ද ඒ පිළිබඳ අවබෝධ කොට ගෙන ඒ අනුව ක්‍රියා කළ යුතු කාලය එළඹ ඇති බව අවධාරණය කළයුතුය.

පිරිවෙන් කේන්ද්‍ර කොට ගෙන බිහි වූ විශ්වවිද්‍යාලවල - විශේෂයෙන් දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ලෙස හැඳින්වෙන විද්‍යෝදය පිරිවෙන මුල් කොට ගත් විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති ධුරන්දර අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන්ගේ ගුණ සැමරීමේ දී බලධාරීන් මෙන්ම ගුරු ශිෂ්‍ය දෙපාර්ශ්වයම ඇතුළු සියල්ලන් විසින් ප්‍රථමයෙන් කළ යුතුව ඇත්තේ උන්වහන්සේගේ දර්ශනය අවබෝධ කොට ගැනීමය. උන් වහන්සේ විද්‍යෝදය මහ පිරිවෙනේ ශිෂ්‍යයෙකු, ගුරු භවතෙකු, පරිවේණාධිපති මෙන්ම විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපති ලෙස අනුගමනය කරන ලද ප්‍රතිපත්ති ගරුක, විනය ගරුක, දූරදර්ශී, ශාස්ත්‍රකාමී මෙන්ම ශික්ෂාකාමී වූ ජීවන රටාව පමණටම ශාස්ත්‍රීයමය හා පරිපාලනමය කටයුතු ද ආදර්ශයට ගැනීමය. ඒ අනුව විශේෂයෙන් අපේ වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පමණක්වත් අනුරාධපුර අවධියේ පැවති මහා විහාර, අභයගිරි, ජේතවන වැනි විශ්ව කීර්තියට පත් පිරිවෙන් විශ්වවිද්‍යාල තත්ත්වයට වැඩි දියුණු කර ගැනීම අවශ්‍යම බව අවබෝධකොට ගෙන ඒ අනුව අපේ ''මෙහෙවර'' සකසා ගෙන ක්‍රියාත්මක වීම අපේ වගකීම බව පැවසුව හොත් කිසිවෙකු ඊට විරුද්ධ නොවන බවට ඒකාන්ත වශයෙන්ම විශ්වාස කරමි.

නිදහසින් පසු හටගත් ජාතික පුනර්ජීවනයත් සමඟ වර්ෂ 1956යේදී ඇතිවූ දේශපාලන පෙරළියෙන්බිහිවූ උද්ඝෝෂණයේ ප්‍රතිඵලයක් ලෙස 1958 දී ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව විසින් සම්මත කළ පනතක් මගින් එකල පැවති මාලිගාකන්දේ විද්‍යෝදය මහ පිරිවෙන ''ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය'' බවට පත් කෙරිණි. එදා එපරිද්දෙන් ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය බවට පත් කරණු ලැබුවේ 1873 දී හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමිපාණන් වහන්සේ විසින් එකළද නැගී ආ ජාතික ප්‍රබෝධයට උත්තේජනයක් සැපයීම සඳහා කොළඹ මාලිගාකන්දේ ආරම්භ කරන ලද විද්‍යෝදය පිරිවෙන බව ද මෙහි දී සිහිපත් කර ගැනීම අතිශය වැදගත් ය. වර්තමානයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය බවට පත් වී ඇත්තේ එම ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලය බව ද

සැළකිල්ලට ගත් කළ එමගින් ශ්‍රී ලංකාවේ පිරිවෙන් විශ්වවිද්‍යාලවල මෑත කාලීන ඉතිහාසයෙන් වසර 150කට ආසන්න කාලයක් තුළ සිදු වූ වර්ධනය පැහැදිලි කර ගත හැකි වේ.

එහෙත් ශ්‍රී ලංකාවේ ජාතික අනන්‍යතාව ගොඩ නැගීමේ දී අපේ උරුමය හැඩගැස්වූ බෞද්ධ විශ්වවිද්‍යාල ක්‍රමය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට එය ප්‍රමාණවත් නොවේ. ඒ සඳහා අපරදිග ජාතීන්ගේ ග්‍රහණයට හසුවීමෙන් පසු අපේ අනන්‍යතාව යටපත් කොට අපේ උරුමය අමතක කරවා ඇති වර්තමානයේ සිට ආපසු හැරී බැලිය යුතුය.එනම් ව්‍යවහාර වර්ෂය ක්‍රමයට පෙර තුන්වෙනි සියවසේ පටන් මෙරට වර්ධනය වූ සුවිශේෂී බෞද්ධ අධ්‍යාපන ක්‍රමය වූ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සහ එම පද්ධතියේ ඉහළම ආයතන වූ පිරිවෙන් විශ්වවිද්‍යාලවල ඉතිහාසය පිළිබඳව ආපසු හැරී බැලිය යුතුය. වර්තමානයේදී සිදුවන සකළවිධ සංවර්ධනයේ නාමයෙන් සමස්ත ජාතිය ම පරිහානියේ පතුලට කිඳා බසිමින් සිටින අපට එකී අගාධයෙන් ගොඩ ඒමට මඟ ශ්‍රී සෝරත නාහිමියන් විසින් එදා ජාතියට දායාද කරන ලද බව නොරහසකි. ඒ පිළිබඳව බලවත් සේ අගය කරමින් ප්‍රශංසා කරනු ලබන මුත් ඒ මඟ වූ අතීත සංවර්ධනයේ ගති ලක්‍ෂණ ආදර්ශයට නොගන්නේ මන්දැ යි සළකා බැලිය යුතු කාලය එළඹ ඇති බව අවධාරණය කරන්නේ උන්වහන්සේ වෙත ඇති මහත් ගෞරවය නිසාය. වර්තමානයට පමණක් නොව අනාගතයට ද කාලෝචිත පරිදි සකසා ගත හැකියයි උන්වහන්සේ විසින් ඉස්මතු කළ ඒ බෞද්ධ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමවේදය මත පදනම් වූ අතීත ශ්‍රී විභූතිය හෙවත් වර්තමාන අර්ථ විග්‍රහය අනුව නම්''ජාතික සංවර්ධනය'' යළි ගොඩ නගා ගතහොත් පරිහාණිය කරා ඇදී යමින් සිටින අපේ ගමන් මඟ යහපත් අතකට යොමු කරවා ගත හැකි වනු ඇත.

එදා මෙන්ම අදත් ඒ සඳහා පුරෝගාමීවිය යුත්තේ විශ්වවිද්‍යාලය යි. විශේෂයෙන් පිරිවෙන් විශ්වවිද්‍යාලයයි. එයිනුත් අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නා හිමියන් විසින් වර්ෂ 1873 දී ආරම්භ කරන ලදුව 1958 දී නූතන මාදිලියේ විශ්වවිද්‍යාලයක් බවට පත් කරන ලද විද්‍යෝදය පිරිවෙන් විශ්වවිද්‍යාලය වෙත පැවරෙන වගකීම අති පුළුල් ය. නූතන ආකාරයට ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලය ලෙස නම් කොට, නූතනයේ සිදුවන විවිධ විපර්යාසයන්ට අනුකූල ලෙස හැඩගැසෙමින් ද අපරදිග විශ්වවිද්‍යාලවල ආකෘතියට හැඩ ගැසුණ සෙසු විශ්වවිද්‍යාල අනුකරණය කරමින් ද අපේ දේශීය විශ්වවිද්‍යාල සම්ප්‍රදාය මුළුමනින්ම අමතක කොට පරිහානිය කරා ඇදී යන ගමනේ දී සමාජ සාරධර්මවල සෝදා පාළුවට රුකුල් දීම, ශාස්ත්‍රීය කටයුතු නොසළකා හැරීම, මුදල් සහ විවිධ ලාභ ප්‍රයෝජන හඹා යාම වැනි බෞද්ධ ඉගැන්වීම්වලට පටහැනි ගති ලක්‍ෂණ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උරුමකරුවා වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට කිසිසේත් නොගැලපෙන බව පැහැදිලි කරගැනීම සඳහා අතීත පිරිවෙන් විශ්වවිද්‍යාලවල පැවැත්ම පිළිබඳ තොරතුරු ස්වල්පයක් සළකා බැලීම අවස්ථාවෝචිත වනු ඇතැයි සළකමි.

## අතීත පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සහ පිරිවෙන් විශ්ව විද්‍යාල

දේවානම්පියතිස්ස රජ සමයේ දී (අදින් සියවස් 24 කට පෙර) බුදු දහම විධිමත් පරිදි ස්ථාපනය කිරීමත් සමඟ ජනජීවිතයේ සෙසු අංගමෙන්ම අධ්‍යාපන කටයුතු ද විධිමත් ලෙස සංවිධානය කෙරිණි. බුදුදහමත් සමඟ මෙරටට ලැබුණු අලුත්ම සමාජ ස්ථරය වූ භික්ෂූන් වහන්සේ අධ්‍යාපනය

සඳහා ම වෙන් වූ පිරිසක් වීම ද උන්වහන්සේ ඉගෙනුම ලැබූ ශිෂ්‍යයන් පමණට ම දැනුම බෙදා දුන් ගුරුවරුන් වීම ද කැපී පෙණුන ලක්‍ෂණයක් විය. ඒ නිසාම බුදු දහම මෙරට ස්ථාපනය කළ මුල් කාලයේ දී භික්‍ෂූන් වහන්සේ වාසය කළ ආරාමය මෙන්ම අධ්‍යාපන මධ්‍යස්ථානය වූ පිරිවෙන දෙකක් නොව එකක් ම විය. දේවානම්පියතිස්ස රජු විසින් මිහිඳු හිමි ඇතුළු පිරිසට වාසය කිරීම සඳහා මුලින්ම ඉදි කරන ලද ආරාමය වූ කාලප්‍රාසාදය මෙන්ම පසුව ඉදිකරන ලද සුනහත, දීඝචංකමන, ඵලග්ඝ, මරුගන ආදී ආරාම ද දික්සඳ සෙනෙවියා විසින් ඉදි කරන ලද ආරාමය ද ප්‍රධාන පිරිවෙන් වශයෙන් හඳුන්වනු ලබන්නේ ඒවා භික්‍ෂූන් වහන්සේගේ වාසස්ථාන වශයෙන් මෙන්ම ශාස්ත්‍රශාලා වශයෙන් ද භාවිත වූ බැවිනි.

දේවානම්පියතිස්ස රජු විසින් මහමෙව්නා උයනේ ඉදිකරන ලද තිස්සමහාරාමය පසු කලෙක මහා විහාරය වශයෙන් පුළුල් වෙද්දී එයට අනුබද්ධ භික්‍ෂූන් වහන්සේ ගේ වාසය සඳහා වූ ආරාම සහ ශාස්ත්‍ර ශාලා වෙනම ඉදිකිරීමත් සමඟ භික්‍ෂූන් වහන්සේ විසින් අධ්‍යාපනය ලබා දෙන ශාස්ත්‍ර ශාලාව පිරිවෙන බවට පත් වේ. එක එල්ලේම අධ්‍යාපන ආයතනයක ස්වරූපය ගත් පිරිවෙන ආරම්භ වූ අවස්ථාව වාර්තාගත වන්නේ ව්‍යවහාර වර්ෂ 4 වෙනි සියවසේ දී බුද්ධදාස රජු විසින් (ව්‍යවහාර වර්ෂ 336 - 365) මහාවිහාර සීමාව තුල මයුරපාද නමින් පිරිවෙනක් කරවා එම විහාරවාසී භික්‍ෂූන් වහන්සේට අධ්‍යාපනය ලබා දීමට කටයුතු සැලැස් වූ අවස්ථාවේ දීය. ක්‍රමයෙන් මහාවිහාරයට අමතරව අභයගිරිය සහ ජේතවනාරාමය ඉදි වීමත් සමඟ මහ පිරිවෙන් රැසක් බිහි විය. ඊට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශවල පැතිර පැවති දහස් සංඛ්‍යාත භික්‍ෂු ආරාම සියල්ලම පාහේ කුඩා පිරිවෙන් අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස යොදා ගැණින.

මහාවිහාරය,අභයගිරිය සහ ජේතවනාරාමය ආදී වූ ප්‍රධාන මධ්‍යස්ථානවල දේශීය මෙන්ම විදේශීය භික්‍ෂූන්වහන්සේ නවාතැන් ගෙන අධ්‍යාපන කටයුතු කළ අතර ඒවා අනුබද්ධව පිරිවෙන් රාශියකින් සමන්විත වූ විශ්ව විද්‍යාල තත්ත්වය දැරීය. ව්‍ය. ව. 5 වෙනි සියවස පමණ තෙක් මෙම ආයතනවල වාසය කළ භික්‍ෂූන් වහන්සේ ධර්මය කටපාඩම් කොට සජ්ඣායනා කිරීම මගින් ධර්මය ප්‍රචාරය කිරීමට සහ ධර්මය ඉගැන්වීමටමුල් තැන දුන් නමුත් ව්‍ය. ව. 5 වෙනි සියවසෙන් පසුව දක්නට ලැබුණ මූලික ලක්‍ෂණයක් වූයේ ග්‍රන්ථකරණය, පර්යේෂණ කිරීම සහ අධ්‍යාපනය ලබා දීමය. ව්‍ය. ව. 5 වෙනි සියවස දක්වා කිසිදු ග්‍රන්ථකරණයක් සිදු නොවූ බවක් එයින් අදහස් නොකෙරේ. ව්‍ය. ව. 3 වෙනි සියවසේ දී මිහිඳු හිමියන් වැඩ වාසය කළ කාලයේ දීම පාලි පෙළපොත්වල අටුවා දීපවාසීන්ගේ භාෂාවෙන් ලියා තැබූ බව කියවෙන අතර එහි පිටපත් උන්වහන්සේ වැඩ වාසය කළ දික්සඳ සෙනෙවි පිරිවෙනේ තැන්පත් කොට තැබූ බව කියවෙන සාධක ඇත. එසේම වලගම්බා රජු ගේ රාජ්‍ය පාලන කාලයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළ අතර එතැන් පටන් විවිධ භික්‍ෂූන්වහන්සේ විසින් විවිධ කෘති රචනා කිරීම අඛණ්ඩව සිදු කෙරිණ.

ව්‍ය. ව. 5 වෙනි සියවස වන විට හෙළ අටුවා රැසක් තිබූ අතර ඒවායින් මහ අටුවා, මහා පච්චරී අටුවා, කුරුන්දි අටුවා, අන්ධ අටුවා යනාදිය ප්‍රධාන විය. ව්‍ය. ව. පස්වෙනි සියවස දක්වා කාලය තුළ හෙළ බසින් මෙන්ම පාලි සහ සංස්කෘත භාෂාවලින් ග්‍රන්ථ කිහිපයක් ම ලියැවී ඇති අතර

එකම කාල පරිච්ඡේදය අළලා ලියා ඇති දීපවංසය සහ මහාවංසය ද මහා චේතිය වංසට්ඨ කථාව, උත්තර විහාර වංසට්ඨ කථාව, සීහළ නමස්කාර වර්ණනා, මහා බෝධිවංශ කථා, මුල් එළු බෝධිවංශය, ඇතුළු ග්‍රන්ථ රැසක් පස්වෙනි සියවස වන විට මහා විහාරයට අනුබද්ධිත ග්‍රන්ථකාර පිරිවෙන ප්‍රධාන කොට ගත් අනුරාධපුරය, රෝහණ දේශය සහ කැලණිය වැනි ප්‍රදේශවල පිරිවෙන්වල තැන්පත් කොට තැබූ බවට සාධක ඇත. මහා විහාරයට අනුබද්ධ දික්සඳ සෙනෙවි පිරිවෙනේ සිට මහාවංශය ලියූ මහානාම හිමියන් මෙන්ම ග්‍රන්ථකාර පිරිවෙනේ වැඩ වාසය කරමින් ග්‍රන්ථ කරණයෙහි යෙදුන බුද්ධඝෝෂ හිමියන් ද සිංහල අට්ඨ කථා පරිහරණය කළ බව උන්වහන්සේගේ කෘතිවල දක්වා ඇත. පස්වෙනි සියවස වන විටත් මෙය එය නේවාසික විශ්ව විද්‍යාලයක තත්ත්වයට පත්ව තිබූ අතර දේශීය මෙන්ම විදේශීය ශිෂ්‍ය භික්ෂූන්වහන්සේ ඊට අනුබද්ධිත ආයතනවල නේවාසිකව අධ්‍යාපනය සහ පර්යේෂණ කටයුතුවල නිරත වූ බව එයින් පැහැදිලි ය.

මහාවිහාරය පමණක් නොව අභයගිරිය ද නේවාසික විශ්ව විද්‍යාලයක තත්ත්වය දැරූ බවට සාධක ඇත.චීන ජාතික පාහියන් භික්ෂුන් වහන්සේ ව්‍ය. ව. 412- 414 දක්වා අභයගිරියේ පර්යේෂණ කටයුතුවල නියැලී සිටි බව ද ඒ අවධියේ අභයගිරියේ භික්ෂූන් වහන්සේ 5000 ක් පමණ ද, මහා විහාරයේ 3000 ක් පමණ ද මිහින්තලේ 2000 ක් පමණ ද වාසය කළ බව පාහියන් භික්ෂූන් වහන්සේ සිය දේශාටන වාර්තාවේ සඳහන් කොට ඇත. සෑම භික්ෂු ආරාමයක්ම පිරිවෙනක් වූවා සේම සෑම පිරිවෙනක් පාසාම පුස්තකාල පවත්වා ගෙන යාම ද අනුරාධපුර අවධියේ අධ්‍යාපන කෙෂ්ත්‍රයේ කැපී පෙනුන ලකෂණයක් විය. ග්‍රන්ථකාර පිරිවෙන මහා විහාරයේ පුස්තකාලය වූ බව ද උත්තර මූලය සහ කප්පර මූලය අභයගිරියෙහි තිබූ පුස්තකාල දෙකක් වූ බව ද සැලකේ. ග්‍රන්ථකාර පිරිවෙනේ සිට පර්යේෂණ කටයුතුවල නියැලුන බුද්ධඝෝෂ හිමියන් ගේ කෘතිවල දක්ඛිණගිර, හත්ථිකුච්ඡි, චේතිය ගිරි, චිත්තල පබ්බත වැනි පිරිවෙන් සහ ආගමික විද්‍යායතන පිළිබඳවත් ඒවායේ වැඩ විසූ භික්ෂූන් වහන්සේ පිළිබඳවත් තොරතුරු දක්වා ඇත.

විශ්වවිද්‍යාලවලට ඇතුලත් වී පර්යේෂණ නිබන්ධන සම්පාදනය කළ උපාධි අපේක්ෂකයන් තමා නේවාසිකව සිටි විශ්ව විද්‍යාලයේ පමණක් නොව රට පුරා විසිර පැවති බොහෝ විශ්ව විද්‍යාල සහ අනුබද්ධිත ආයතන වලට අයත් පුස්තකාල පරිහරණය කරමින් ද විද්වතුන් සමඟ සාකච්ඡා කරමින් ද දත්ත එක් රැස් කිරීමේ විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමයක තිබිය යුතු විශිෂ්ඨ ලකෂණ එදා පිරිවෙන් විශ්ව විද්‍යාල ක්‍රමය තුළ ද ක්‍රියාත්මක වූ බව මෙම තොරතුරුවලින් පැහැදිලි වේ.බුද්ධඝෝෂ හිමියන් පමණක් නොව පාහියන්, බුද්ධදත්ත, ධම්මපාල වැනි වෙනත් විදේශීය පඬිවරුන් මෙරටට පැමිණ පිරිවෙන් විශ්වවිද්‍යාලවල පර්යේෂණ කටයුතුවල නියැලුන බවත් බෞද්ධ පොත් පත්වල පිටපත් රැගෙන ගිය බවත් සඳහන් වේ.

අපරදිග විශ්ව විද්‍යාලවලින් උරුම වූ බව සළකමින් අති විශිෂ්ඨ ක්‍රම ලෙස අප විසින් අගයනු ලබන විශ්ව විද්‍යාල අධ්‍යයන සහ පරිපාලන කටයුතුවලට අදාළ අංග ලකෂණ සියල්ලම පාහේ අපරදිග රටවල විශ්ව විද්‍යාල බිහි වීමටත් පෙර පැරණි ශ්‍රී ලංකාවේ පිරිවෙන් විශ්ව විද්‍යාලවල

ඉතා පුළුල් ලෙස ක්‍රියාත්මක වූ බව අප අමතක කළ යුතු නොවේ. යුරෝපා රටවල ප්‍රචලිත නූතන විශ්ව විද්‍යාල ක්‍රමය ආරම්භ වූයේ 11 වෙනි 12 වෙනි සියවස්වල දී බව ද වර්තමාන ලෝකයේ පවා විශ්ව කීර්තියට පත්ව තිබෙන ඉතාලියේ පාදුවා සහ සලේනෝ, ස්පාඤ්ඤයේ බොලොග්නා, ප්‍රංශයේ පැරිස්, එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් වැනි විශ්වවිද්‍යාල ආරම්භ වූයේ එම අවධියේ බව ද සැලකිල්ලට ගත් කළ භාවිත වර්ෂ ක්‍රමය ආරම්භයටත් පෙර අවධියේ තරම් ඈත කාලයේ සිට ශ්‍රී ලංකාවේ පැවති පිරිවෙන් විශ්වවිද්‍යාලවල බුදු දහමේ ඉගැන්වීම්වලට අනුව දේශයේ ජාතික අනන්‍යතාව ගොඩ නඟමින් ඉතා සැලසුම් සහගත ලෙස විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ පර්යේෂණ හා පරිපාලන කටයුතු සිදු කළ බවට සාධක ඇත. රාජ්‍ය වර්ෂ පස්වැනි සියවසේ දී ශ්‍රී ලංකාවේ පැරණි පිරිවෙන් විශ්වවිද්‍යාලවල අධ්‍යාපන කටයුතු පරිපාලනය සිදු වූ ආකාරය පිළිබඳ කදිම නිදසුනක් බුද්ධඝෝෂ හිමියන්ට හෙළටුවා පාළි භාෂාවට පරිවර්තනය කිරීමට අවස්ථාව ලබා දීම සහ උන්වහන්සේ එම කාර්යභාරය ඉටු කළ ආකාරය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වේ.

තමන් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණීමට හේතුව මෙරට භික්ෂූන් වහන්සේට පැහැදිලි කළ බුද්ධඝෝෂ හිමියන්ට අනුව උන්වහන්සේ පැමිණියේ හෙළටුවා පාලි භාෂාවට පරිවර්තනය කිරීම සඳහා ය. එහෙත් හෙළටුවා පාලියට නැඟීමේ කාර්යට එක එල්ලේම අත ගැසීමට බුද්ධඝෝෂ හිමියන්ට ඉඩ නොලැබිණි. එම කාර්‍ය්‍ය සඳහා බුද්ධඝෝෂ හිමියන්ගේ සුදුසුකම් පරීක්ෂාකර බලා නිගමනයකට එළඹිය යුතු බව එකල මහා විහාරයේ ද්වාර පණ්ඩිත ධුරය දැරූ සංඝපාල මහ තෙරණුවන් ප්‍රධාන මහා විහාර වාසී උගත් මහ තෙරවරුන් ගේ තීරණය විය.

'' අන්තො ජටා බහි ජටා - ජටාය ජටිතා පජා

තං තං ගෝතම පුච්ඡාමි - කො ඉමං විජටයේ ජටං''

සංයුක්ත නිකායේ එන ගාථාව විස්තර කරමින් නිබන්ධනයක් සකස් කොට පිටපත් තුනකින් ඉදිරිපත් කිරීමට උන්වහන්සේට නියම කෙරිණි. බුද්ධඝෝෂ හිමියෝ ද මුළු බුද්ධ භාෂිතයම අළලා ත්‍රිපිටකයට ප්‍රස්ථාවනාවක් හා සමාන අතිශය සාරගර්භ ධර්මයක් අන්තර්ගත කරමින් විසුද්ධි මග්ගය ලියා ඉදිරිපත් කළහ.

මෙම සිද්ධියෙන් පැරණි ශ්‍රී ලංකාවේ පස්වෙනි සියවස තරම් ඈත කාලයේ දී පැවති භික්ෂු අධ්‍යාපනය පිළිබඳව හෙළිවන කරුණු රාශියකි. බුද්ධඝෝෂ හිමියන් පරිවර්තන කාර්යක් සඳහා මෙරටට පැමිණීමෙන් පැහැදිලි වන්නේ එකළ විශ්වවිද්‍යාල තත්ත්වයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් මහා විහාරය විදේශවල පවා ප්‍රචලිතව පැවති බවත් විදේශිකයින් පවා අධ්‍යාපන කටයුතු සඳහා එම විශ්වවිද්‍යාලයට පැමිණි බවත් ය. තව ද බුද්ධඝෝෂ හිමියන් ගේ දැනුම පරීක්ෂා කර බැලීම සඳහා පරීක්ෂණයක් පැවැත්වීමෙන් පැහැදිලි වන්නේ ප්‍රවීන උගත් ආචාර්‍ය්‍ය භික්ෂූන් වහන්සේ එකළ මහා විහාරයේ වැඩ වාසය කළ බව යි. එසේම එකී පරීක්ෂණයේ ස්වභාවය දෙස බලන විට එය අද පවා ලොව පුරා විශ්වවිද්‍යාලවල ශාස්ත්‍රීය දැනුම පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන පර්යේෂණාත්මක කටයුතු මුල් කොට ගෙන නිබන්ධනයක් ඉදිරිපත් කිරීමේ පශ්චාත් උපාධි පරීක්ෂණයක ස්වභාවය දැරූ බව පෙනේ. එමෙන්ම බුද්ධඝෝෂ හිමියන් හෙළටුවා පරිවර්තනය කිරීම සඳහා පැමිණීමෙන් එකල මෙරට අධ්‍යාපන කටයුතු ඉතා පුළුල් ලෙස සිංහල භාෂාවෙන් සිදු කෙරුණ බව ද පැහැදිලි වේ.

බුද්ධඝෝෂ හිමියන් ට නියම කල පරීක්ෂණයට අනුව ඉතා උසස් මට්ටමකින් විසුද්ධි මග්ගය ලිවීමෙන් පසුව උන්වහන්සේගේ පාණ්ඩිත්‍යය පිළිබඳව සැකහැර දැන ගත් මහා විහාර භික්ෂූන් වහන්සේ හෙළටුවා පාලියට නැගීමේ කාර්‍යය උන්වහන්සේට භාර කළහ. උන්වහන්සේ ද විනය පිටකය අළලා සමන්තපාසාදිකා ප්‍රධාන කොට ගත් අටුවා කථා රැසක් සම්පාදනය කළහ. මෙම පුළුල් පර්යේෂණාත්මක ග්‍රන්ථකරණ කටයුතු මගින් ත්‍රිපිටකය පිළිබඳව බුද්ධඝෝෂ හිමියන් තුළ තිබූ ධර්ම ඥාණය ප්‍රදර්ශනය විය. එමගින් මහත් වූ ගෞරවාදරයට පත් වූ උන්වහන්සේ ට සංඝපාල හිමි ප්‍රධාන මහා විහාර භික්ෂූන් වහන්සේ විසින් '' මහා විහාර වංසාලංකාර''යන උපාධි නාමය ප්‍රදානය කරන ලදි. සම්භාවනීය ශාස්ත්‍රීය දැනුම ප්‍රකාශයට පත් කිරීම වෙනුවෙන් වර්තමානයේ දී මෙන්ම උපාධි ප්‍රදානය කිරීම පවා එදා පිරිවෙන් විශ්ව විද්‍යාල මගින් සිදු කරන ලද බව එයින් පැහැදිලි වේ.

මෙම පිරිවෙන් සහ පිරිවෙන් විශ්ව විද්‍යාලවල ඉගැන්වූ සහ ප්‍රගුණ කළ විෂය ක්ෂෙත්‍ර සැළකිල්ලට ගත් කළඑදා මේ රටේ පැවති අධ්‍යාපන ක්ෂෙත්‍රයේ විශිෂ්ඨත්වය පැහැදිලිවේ. අධ්‍යාපනික කටයුතුවලට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සකස් කර ගැනීම එකළ පිරිවෙන් අධ්‍යාපනයේ විශේෂ අංගයක් විය. අනුරාධපුර අවධියේ සිට වර්තමානය දක්වාම මේ රටේ ලියා ආරක්ෂා කර ඇති දහස් සංඛ්‍යාත පුස්කොළ පොත් සියල්ලම භික්ෂු ආරාම සහ පිරිවෙන්වලත් හමුවන අතර ලිපි ද්‍රව්‍යයන් වශයෙන් පුස්කොළ සහ පන්හිඳ සකස්කර ගැනීමත් ඒවා උපයෝගී කරගෙන ග්‍රන්ථ කරණයත් පිරිවෙන් අධ්‍යාපනයේ කැපී පෙණුන ලක්ෂණ විය. පුස්කොළ සහ පන්හිඳ සකස් කිරීමත් ඒවා භාවිත කොට අකුරු ලිවීමත් ඒ තරම් පහසු කාර්‍යයක් නොවූ බැවින් වර්තමානයේ මෙන් නොව එදා පර්යේෂණ කටයුතු සහ ග්‍රන්ථ කරණය අතිශය දුෂ්කර විය. එම කාර්‍යයන් පිළිබඳ පුහුණුවක් ලැබීම සහ එකී ශිල්ප ප්‍රගුණ කිරීමත් ග්‍රන්ථකරණ කටයුතු පුළුල් වෙද්දී පුස්කොළ සහ පන්හිඳ සඳහා වූ ඉල්ලුම ද ඉහළ ගිය බැවින් ඒවා සැපයීමද පිරිවෙනට භාර වූ කාර්ය භාරයක් විය.

මිහිඳු මහ රහතන් වහන්සේ මෙරට වැසියන්ට බුදු දහම දේශනා කිරීමත් සමග මුල් අවධියේ එක්වරම වැදගත් කාර්‍යයන් දෙකක් සිදුවී ඇත. එනම් පාලි භාෂාවෙන් දේශනා කොට තිබූ ධර්මය ඉගෙනීම සඳහා මෙරට භික්ෂූන් වහන්සේ පාලි භාෂාව හැදෑරීම සහ එම ධර්මය මෙරට ජනතාවට වඩාත් පැහැදිලිව අවබෝධකොට දීම සඳහා පාලි ධර්ම කොටස් හෙළ බසට පරිවර්තනය කිරීමයි. 5 වෙනි සියවස වන විට එම කාර්‍යයන් දෙකම බොහෝ දුරට ඉටු වී තිබීමෙන් එකළ අධ්‍යාපන කටයුතු සිංහල සහ පාලි යන භාෂා දෙකෙන්ම සිදුකොට ඇති බව පැහැදිලි වේ. මහා විහාරයේ භික්ෂූන් වහන්සේ පාලි භාෂාව ප්‍රගුණ කළ අතර එහි උගන්වනු ලැබුවේ ප්‍රධාන වශයෙන් ත්‍රිපිටකය සහ අටුවා පමණි. එහෙත් අභයගිරියේ භික්ෂූන් වහන්සේ එම විෂයයන් ට අමතරව සංස්කෘත භාෂාව ද ජ්‍යොතිෂ් ශාස්ත්‍රය, වෛද්‍ය ශාස්ත්‍රය, භූත විද්‍යාව වැනි විෂයයන් ද හැදෑරූහ. පසු කාලය වන විට සියලුම පාහේ පිරිවෙන්වල විෂය ක්ෂේත්‍රයට සිංහල, පාලි, සංස්කෘත යන විෂයයන් මෙන්ම එම භාෂාවල ව්‍යාකරණ, ඡන්දස්, කාව්‍ය, තර්ක ශාස්ත්‍රය, ප්‍රතිමා නිර්මාණය සහ චිත්‍ර කලාව වැනි විෂයයන් ද එකතු වී ඇත.

වර්ෂ 1017 සිට 1070 දක්වා පැවති චෝළ ආධිපත්‍යය පරාජය කිරීමෙන් පසුව රජ පැමිණි 1 වෙනි විජයබාහු, මහා පරාක්‍රමබාහු, නිශ්ශංකමල්ල යනාදී රජවරුන් යටතේ සෙසු ක්ෂේත්‍රවල මෙන්ම පිරිවෙන් අධ්‍යාපනයටද නව පණක් දෙනු ලැබීය.

අනතුරුව දඹදෙණි හා කුරුණෑගල රාජධානි අවධිවලදී මෙම පිරිවෙන් අධ්‍යාපනයට ලැබුන රාජ්‍ය අනුග්‍රහය පුළුල් වූ අතර ඒවායේ ඉගැන්වූ විෂය ක්ෂේත්‍රද පුළුල් විය. ග්‍රන්ථකරණයේදී විවිධ ක්ෂේත්‍ර අළලා ගද්‍ය පද්‍ය කාව්‍ය නිර්මාණය කළ බව සද්ධර්මරත්නාවලිය සහ පූජාවලිය යන ගද්‍ය ග්‍රන්ථ ද කව් සිළුමිණ වැනි පද්‍ය ග්‍රන්ථද සිදත් සඟරාව වැනි සිංහල ව්‍යාකරණ ග්‍රන්ථද  කාව්‍ය කරණය පිළිබඳ නීති රීති ඇතුලත් එළු සදැස් ලකුණ ද භික්ෂූන් වහන්සේගේ පැවැත්ම පිළිබඳ නීති රීති ඇතුළත් "දඹදෙනි කතිකාවත" මෙන්ම දෙවෙනි පරාක්‍රමබාහු රජුගේ දින චරියාව ඇතුලත් "කඳවුරු සිරිත" යනාදි කෘතිවලින් පැහැදිලි වේ. ඒ අනුව ශ්‍රී ලංකාව අපරදිග ජාතීන්ගේ ග්‍රහණයට ගොදුරුවීම ආරම්භ වූ 16 වන සියවස වන විටත් මෙරට ප්‍රධානම අධ්‍යාපන ආයතනය පිරිවෙන සහ පිරිවෙන් විශ්වවිද්‍යාල වූ අතර පැපිළියානේ සුනේත්‍රාදේවී පිරිවෙන ප්‍රධානකොටගත් වීදාගම ශ්‍රී ඝනානන්ද පිරිවෙන, තොටගමුවේ විජයබා පිරිවෙන, කෑරගල පද්මාවතී පිරිවෙන, දෙවිනුවර දියතිලක පිරිවෙන යනාදී විශ්වවිද්‍යාල මට්ටමේ මහ පිරිවෙන් රාශියක් පැවතිණි. ඒවා මගින් භික්ෂූන් වහන්සේට පමණක් නොව ගිහියන්ට ද අධ්‍යාපනය ලබාදුන් අතර ආගමික පමණක් නොව වෙනත් විවිධ ක්ෂේත්‍රවලට අයත් ග්‍රන්ථ කරණය කැපී පෙනුණ ලක්ෂණයක්ව පැවතිණි.

16 වෙනි සියවස ආරම්භයේ දී අපරදිග ජාතීන්ගේ ග්‍රහණය යටතේ කිතු දහම හඳුන්වාදීම සහ විශේෂයෙන් නව පාසැල් ක්‍රමයක් ඔස්සේ එය ව්‍යාප්ත කිරීමට  පියවර ගැනීමත් බ්‍රිතාන්‍යයන් යටතේ පරිපාලන කටයුතුවල පහසුව සඳහා ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීමත් 19 වෙනි සියවසේ තෙවෙනි දශකයේ සිට අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි භාෂාව බව නීතිගත කිරීමත් සමග පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සහ ඒ සමග සිංහල පාලි සංස්කෘත යනාදී භාෂා ඉගෙනිම අභාවයට පත්වන තත්ත්වයක් උදාවී තිබිණි.

වර්ෂ 1818 දී සහ 1848 දී විදේශ ආධිපත්‍යය මෙරටින් තුරන් කිරීම සඳහා ආයුධ සන්නද්ධ අරගල දෙකක් සිදුකළ නමුත් ඉතා විනාශකාරී ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඒවා සමූලඝාතනය කෙරිණි. එයින් අධෛර්යමත් නොවූ බෞද්ධ භික්ෂූන් වහන්සේ මෙන්ම ගිහි විද්වත්හු 1850 පමණ කාලයේ සිට බුදු දහම, සිංහල භාෂාව, පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සහ ජාතික අනන්‍යතාව යළි නගා සිටුවීමට ක්‍රියාත්මක වූහ.

වලානේ ශ්‍රී සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ විසින් රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙන මුල්කොටගෙන ඓතිහාසික පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය යළි නගාසිටුවා ගැනීමේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රේෂ්ඨ භික්ෂූන් වහන්සේ තිදෙනෙකු බිහිකළ අතර උන්වහන්සේ 19 වෙනි සියවසේ අග භාගයේ මෙරට ආගමික සහ අධ්‍යාපනික නවෝදයක් ඇතිකිරීමෙහිලා පෙරමුණ ගත්හ. හික්කඩුවේ ශ්‍රී

සුමංගල, රත්මලානේ ශ්‍රී ධර්මාලෝක සහ බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ඛිත යන එම භික්‍ෂුන් වහන්සේ තිදෙනා අතුරින් අද දින අප විසින් සමරනු ලබන වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේට සම්බන්ධ වූ එක් විෂය ක්ෂේත්‍රයක් වන විද්‍යෝදය මහ පිරිවෙන හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් විසින් 1873 දී ආරම්භ කරන ලදී. ඒ අනුව සෝරත නාහිමිපාණන් වහන්සේ අනුස්මරණය කෙරෙන උත්සවවලදී හික්කඩුවේ ශ්‍රී සුමංගල මහ නාහිමියන් වහන්සේ ද අනුස්මරණය කිරීමට බුදුරජානණ් වහන්සේගේ කෘතගුණ දැක්වීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන සහ ශ්‍රී සෝරතාභිධාන නායක හිමිපාණන් වහන්සේගේ ප්‍රතිපත්ති අගයනු ලබන කිසිවෙකු විසින් හෝ අමතක නොකරනු ඇත.

වලානේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමිපානන් වහන්සේ අපවත්වීමෙන් පසුව පරමධම්ම චේතිය පිරිවෙනේ ප්‍රධානාචාර්ය ධූරයට පත්වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන පීඨයක් ආරම්භ කිරීමේ ස්ථානයක් ගැන සෝදිසියෙන් පසුවූහ. ලන්සගේ දොන් අන්ද්‍රිස් පෙරේරා අප්පුහාමි නැමති බෞද්ධ ප්‍රභූවරයාට අයත්ව පැවති මාලිගාකන්දේ පිහිටි ඉඩමක් ලබාගත් ශ්‍රී සුමංගල නාහිමිපාණන් වහන්සේ එහි අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළ අතර එය " විද්‍යෝදය" යනුවෙන් නම්කළහ. රජයේ අනුග්‍රහය යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීම රජයේ රැකියාවක් ලබාගැනීම සඳහා විශේෂ සුදුසුකමක්ව පැවති බැවින් එවැනි අවස්ථා නොතිබුන පිරිවෙන්වල අධ්‍යාපනය ලැබීමට බෞද්ධයන් පවා උනන්දු නොවීම නිසා 1873 දෙසැම්බර් මාසයේ ශිෂ්‍යයන් සත් දෙනෙකුගෙන් ආරම්භ කළ විද්‍යෝදය පිරිවෙන පවත්වාගෙන යාම මහත් අභියෝගයක් විය. ශ්‍රී සුමංගල හිමියන් පවා අධ්‍යාපනය ලැබුවා වූද එකළ පැවති ශ්‍රේෂ්ඨතම අධ්‍යාපන මධ්‍යස්ථානය වූද රත්මලානේ පරම ධම්ම චේතිය පිරිවෙනට පවා සිසුන් ඇතුලත් කරගැනීම බෙහෙවින් අසීරු තත්ත්වයකට පත්ව තිබියදී විද්‍යෝදය පිරිවෙන ආරම්භ කොට එය ව්‍යාප්ත කිරීමේ අභියෝගයට සාර්ථකව මුහුණදීමට ශ්‍රී සුමංගල හිමිපාණෝ සමත්වූහ.

වැඩිකල් යාමට පෙර විද්‍යෝදය පිරිවෙන පාලි භාෂාව සහ ථේරවාදී බෞද්ධ දර්ශනය ඉගැන්වීම සම්බන්ධයෙන් සමස්ථ ආසියාවේ තිබූ විශිෂ්ඨතම අධ්‍යාපන ආයතනය බවට පත්වූ අතර එය පැරණි අවධියේ මහා විහාරය, අභයගිරිය, ජේතවනය වැනි පිරිවෙන් විශ්වවිද්‍යාල තරමටම විශ්ව කීර්තියට පත්වෙද්දී විශාල ලෙස විදේශීය ශිෂ්‍යයෝද අධ්‍යාපනය සහ පර්යේෂණ කටයුත සඳහා එහි පැමිණියහ. වසර දෙක තුනක් තිස්සේ ඉතා ඕනෑ කමින් හා දැඩි කැපවීමකින් ඉදිරියට ගෙනගිය විද්‍යෝදය පිරිවෙන විශ්වවිද්‍යාලයක සිරිගෙන තිබිණි. 1876 ජනවාරි 10 වෙනි දින එහි උත්සවයකට සහභාගී වු ශ්‍රීමත් හෙන්රි විලියම් ග්‍රැගරි ආන්ඩුකාරවරයා පිරිවෙන ලබා තිබූ ප්‍රගතියෙන් සතුටට පත්වී එහි නායකත්වය දැරූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමිපාණන් සමග පැවති හිතවත්කමද සැලකිල්ලට ගෙන විද්‍යෝදය පිරිවෙනේ අනාගත අභිවෘද්ධිය උදෙසා ආධාර කිරීමට කැමැත්ත පළකළේය. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු වූ ආනන්ද කුමාරස්සාමි සහ පණ්ඩිත ජේම්ස් ද අල්විස් යන දෙදෙනාගේ යෝජනා ස්ථිරත්වයෙන් සම්මත කළ පනතක් මගින් පිරිවෙනේ අභිවෘද්ධිය උදෙසා වාර්ෂිකව පවුම් හැටක් ප්‍රදානය කිරීමට තීරණය

කෙරිණි. මෙය අන්‍යාගමික රජයක් බෞද්ධ අධ්‍යාපන ආයතනයකට අඛණ්ඩව ප්‍රදානයක් කිරීමට පියවර ගත් මුල්ම අවස්ථාව විය.

පිරිවෙනක් ආරම්භ කිරීමට සුදුසු භූමි භාගයක් ලබාගෙන එහි විද්‍යෝදය පිරිවෙන ආරම්භ කොට එම ආයතනය මෙරට විද්‍යාලෝකයෙන් ආලෝකමත් කිරීම සඳහා අවශ්‍ය සියලු විධි විධාන සලසා ලීමෙන් පමණක් සෑහීමකට පත්නොවූ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් වහන්සේ විසින් ඉටුකරණ ලද ශාස්ත්‍රීය මෙහෙවරද අති විශාලය. බටුවන්තුඩාවේ දේවරක්ඛිත පඬිතුමන් සමග එක්ව මෙරට පමණක් නොව මුළු ලෝකයේම ප්‍රචලිත මහාවංස කෘතිය සිංහලට පරිවර්ථනය කොට ප්‍රකාශයට පත්කීරීම උන්වහන්සේ විසින් ඉටුකරණ ලද අතිශය වැදගත් ශාස්ත්‍රීය මෙහෙවරකි.

එම අවධියේ දක්නට ලැබුන විශේෂ ලක්‍ෂණයක් වූයේ බෞද්ධයන් සහ ක්‍රිස්තු භක්තිකයන් අතර ආගමික දර්ශනය මුල්කොට ගෙන වාද විවාද කිපයක් ඇතිවීමය. ඒ අතර ප්‍රධාන ස්ථානය ගත් බද්දේගම වාදය, ගම්පොල වාදය, ඔරුගොඩවත්තේ වාදය, උදම්විට වාදය සහ විශ්වකීර්තියට පත්වූ ජයග්‍රාහී පානදුරාවාදයේදී අභීතව වාදයට ඉදිරිපත්වූ වාදිභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ට මාර්ගෝපදේශ සපයමින් ජයග්‍රහනය සඳහා අත්වැල් සැපවූයේ හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියෝ වූහ.

තනතුරු පසුපස හඹායනු වෙනුවට නිරායාශයෙන් උන්වහන්සේ වෙත පැමිණි ගෞරව සම්ප්‍රයුක්ත නිලනාම සහ තනතුරු රැසක් දරමින් සිටි හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණන් වහන්සේ රෝගාතුරව රෝහල් ගතවීමෙන් පසුව මහානායක, අනුනායක භික්‍ෂූන්වහන්සේ මෙන්ම රටේ ප්‍රධාන පෙළේ ප්‍රභූවරුන්ගේ ද ශෝකාලාප මධ්‍යයේ 1911 අප්‍රේල් 29 වෙනි දින අපවත් වී වදාල සේක.

ශ්‍රී සුමංගල හිමිපාණන් වහන්සේගේ  අඩි පාරේයමින් විද්‍යෝදය මහ පිරිවෙනට ජාත්‍යාන්තර කීර්තිය ගෙන ආ අද දින අපගේ විශේෂ ගුණසැමරුමට ලක්වී සිටින විද්‍යෝදය මහ පිරිවෙනේ පස්වෙනි පරිවෙනාධිපතිවරයාණන් වූ අති පූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමිපාණන් වහන්සේ අප රටට සදානුස්මරණීය වන කරුණු රාශිය අතර ආණ්ඩුවේ තීරණයක් පරිදි විද්‍යෝදය පිරිවෙන විද්‍යෝදය විශ්වවිද්‍යාලය බවට පත් කළ අවධියේ උන්වහන්සේ විසින් ප්‍රදර්ශනය කරන ලද සංවිධාන ශක්තිය කැපීපෙනේ. එහි මූලික පිරිවෙන මාලිගාකන්දේ එය පිහිටි භූමියේ එලෙසින්ම තබාගැනීමටත් එම භූමියේම ආරම්භ කළ විද්‍යෝදය විශ්වවිද්‍යාලය ඒ සඳහා සුදුසු වෙනත් භූමි භාගයකට ගෙන ගොස් එහි ප්‍රධාන තනතුර වූ උපකුලපති ධූරය දරමින් පැරණි පිරිවෙන් විශ්වවිද්‍යාල අත්පත් කොටගෙන තිබූ කීර්තිය නව පිරිවෙන් විශ්වවිද්‍යාලයට ද ලබාදීමට සුදුසු පරිදි එය සංවිධානය කිරීම පිළිබඳව උන්වහන්සේ විසින් ලබාදෙන ලද අනුශාසනානායකත්ව කුශලතා මෙන්ම පරිණතභාවය අදද සුවිශේෂ ඇගයීමට පත්වන්නකි.

දකුණු පළාතේ ගාල්ලේ වැලිවිටිය ග්‍රාමයේදී දොන් ජොහානිස් කුමාරසිරි ජයවර්ධන වෙදමහතාට සහ ගාල්ලේ උණවටුනේ මල්වත්ත වලව්වේ ඇලිස් අමරසිංහ යුවලට දාව 1897 මැයි 23 වෙනි දින

උපන් කුලකුමරුවාට චන්ද්‍රදාස ජයවර්ධන යන නම තැබීය. චන්ද්‍රදාස කුමරුවාට පෙර උපන් දරුවන් තිදෙනෙකුම අකාලයේ මියගිය බැවින් බියට පත්වී සිටි දෙමව්පියෝ චන්ද්‍රදාස කුමරුවා 15 වෙනි වියට එළඹෙත්ම ඔහු සසුන්ගත කිරීමට තීරණය කොට හික්කඩුවේ තිලකාරාමාධිපතිව වැඩවිසූ පූජ්‍ය කහවේ පේමරතන නාහිමියන්ට දරුවා බාර කළහ. කහවේ පේමරතන හිමියන් විසින් චන්ද්‍රදාස තරුණයා 1912 දෙසැම්බර් 15 වෙනි දින වැලිවිටියේ සෝරත නමින් පැවිදි කරන ලදී. ඉතා දක්ෂලෙස අධ්‍යාපන කටයුතු වල යෙදුන වැලිවිටියේ සෝරත සාමනේරයෝ 1917 මහනුවර මල්වතු මහ විහාරයේදී උපසම්පදාව ලැබ එම වසරේදීම විද්‍යෝදය පිරිවෙනට ඇතුල් වූහ.

ප්‍රවීණ භාෂා ශාස්ත්‍රඥයන්ගේ කෝෂ්ඨාගාරය වැනි මෙම විද්‍යායතනයේදී විද්‍යෝදය පරිවෙනාධිපති පූජ්‍ය මහගොඩ ශ්‍රී ඤාණිස්සර, උප ප්‍රධාන පූජ්‍ය කහවේ ශ්‍රී රතනසාර යන නාහිමිවරුන්ගේ විශේෂ ඇගයීමකට ලක්වූ වැලිවිටියේ සෝරත හිමියෝ ශිෂ්‍ය අවධියේ සිටියදීම තම පාණ්ඩිත්‍ය හෙළිකරන ලිපි රාශියක් විද්‍යෝදය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහයට සපයමින් ශාස්ත්‍රීය සේවයට තම දායකත්වය ඇරඹූහ. සිංහල, පාලි, සංස්කෘත, පුරාවිද්‍යාව, තර්ක න්‍යාය, ඉතිහාසය, ඡන්දොලංකාර, ජ්‍යොතිෂය, ආයුර්වේදය ආදී වසර දහස් ගණනක් ඉපැරණි විවිධ විෂයන් සහ භාෂා ශාස්ත්‍රද විද්‍යෝදය පිරිවෙනේ අධ්‍යාපන පටි පාටියේ මූල විෂයන් වූ අතර සෝරත හිමියෝ ඒවා මැනවින් ප්‍රගුණ කළහ.

විද්‍යෝදය පිරිවෙනේ ආචාර්ය ධූරයකට පත්වීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවීය. දැන උගත් කමෙහි මුල්පෙලේ සිටි ස්‍යාමරාජ ත්‍යාගය හෝ උභයසේකර ස්වර්ණ මුද්‍රිකාව ලබාගත් අයෙකු ඒ සඳහා තෝරා පත්කර ගැනීම සාමාන්‍ය සිරිත විය. විශේෂයෙන් විද්‍යෝදය සම්ප්‍රදාය පිළිබඳව දැනුමක් ඇති එය මැනවින් ආරක්ෂා කරගත හැකි කෙනෙකු වීමද සුදුසුකමක් සේ සැලකිණ. සෝරත හිමියෝ අවසාන ද්විතීයංශයේ ශිෂ්‍යවරයෙකු සිටි අවධියේ උන්වහන්සේගේ භාෂා විශාරද භාවය සහ නිකැළැල් බුද්ධිය පිළිබඳ සෑහීමකට පත්ව සිටි පරිවේණාධිපති කහවේ ශ්‍රී සුමංගල රතනසාර නාහිමි පාණන් වහන්සේ 1922 දී උන්වහන්සේ විද්‍යෝදය පිරිවෙනේ උප ආචාර්ය ධූරයකට පත්කළහ.

වර්ෂ 1923 දී ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ප්‍රාචීන අවසාන පරීක්ෂණයට පෙනී සිටි සෝරත හිමිපාණන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයෙන්ම ප්‍රමුඛයා ලෙස සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රයෙන්ම ගෞරව පංතියෙන් සාමාර්ථය ලබා පිරිවෙන් ශිෂ්‍යයෙකුගේ ශිෂ්‍ය ජීවිතයේ ලද හැකි උතුම්ම ත්‍යාගය වන උභයසේකර ස්වර්ණ මුද්‍රිකාව දිනාගත්හ. උන්වහන්සේගේ ඊළඟ ජයග්‍රහණය වූයේ 1932 විද්‍යෝදය පිරිවෙනේ ආචාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෙකු ලෙස පත්වීමක් ලැබීමය.ඒ අතර ලංකා රජයෙන් ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවේ කල්කටා විශ්වවිද්‍යාලයට ගොස් පර්යේෂණ කටයුතුවල නියැලී සිටි සෝරත ස්වාමීන් වහන්සේ 2500 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් රජය පළකරන්නට යෙදුන පාලි - සිංහල ත්‍රිපිටක ග්‍රන්ථමාලාවේ ප්‍රධාන කතෘ ධූරයට පත්කරන ලදහ. එපරිද්දෙන් පණ්ඩිත උපාධිය ලැබූ වැලිවිටියේ සෝරත ස්වාමීන් වහන්සේ එතැන්

පටන් සිය ජීවිත කාලයම කැපකළේ ඉගැන්වීමට සහ තමා ඉගෙනගත් දේ අන් අයගේ ප්‍රයෝජනය සඳහා ලියා තැබීමටය.

ශ්‍රී සෝරත නාහිමියන්ගේ ධර්ම විනය ලිපිවල කැපී පෙණෙන ලක්ෂණයක් නම් වර්තමාන සමාජයට ගැලපෙන අන්දමට කරුණු ඉදිරිපත් කිරීමයි. එහෙත් ඒ කිසිවිටකත් කිසිදු හේතුවක් නිසා බුදුදහමේ ඉගැන්වීම් විකෘති කිරීමක් උන්වහන්සේ විසින් සිදු නොකිරීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එසේම තුලනාත්මක ධර්මය ඉගෙනීමේ අගය උන්වහන්සේ විසින් නොයෙක් තැන්හි සඳහන් කොට ඇත. ඒ උන්වහන්සේ සතු වූ ආගමික හා වාර්ගික සංහිඳියාව පිළිබඳ දැඩි කැපවීම හා විශ්වාසය නිසාය. 1947 ගුණසේන වෙසක් කලාපයේ පළවූ උන්වහන්සේගේ ලිපියක ඉදිරිපත් කොට ඇති එකී අදහස සැකවින් සඳහන් කොට ඇත්තේ මෙසේය. "………එහෙයින් බයිබලය, කෝරාණය ආදි අන්‍ය ආගම් පිළිබඳ පොත්ද කියවා සමයාන්තර ඥානය දියුණු කර ගන්නා ලෙස බුද්ධිමත් උගත් භික්ෂූන් වහන්සේ කල්පනා කළ යුතුය……..”

පණ්ඩිත වැලිවිටියේ සෝරත නාහිමිපාණන් වහන්සේගේ ශාස්ත්‍රීය දැනුම සහ එම ක්ෂේත්‍රයට උන්වහන්සේ විසින් ඉටුකරණ ලද අපරිමිත සේවය කැටිකොට දැක්වීමට ගනේගම ශ්‍රී සරණංකර නාහිමිපාණන් වහන්සේගේ පහත දැක්වෙන ප්‍රකාශය කදිමට ගැලපේ " සායන පාණිනීත් බුද්ධඝෝෂ මාහිමි හා ගුරුළුගෝමීන් සෝරත නායක මාහිමියන් තුලින් එක්වරම දැකිය හැකි වෙති. පහළොස්වන ශතවර්ෂයේ විසූ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් 19 වෙනි සියවසේ විසූ හික්කඩුවේ ශ්‍රී සුමංගල මාහිමියන් සහ 20 වෙනි සියවසේ විසූ සෝරත නායක හිමියන් එක් කෙනාම තුන්වරක් ඉපදීමෙන් පහල වූ පුනරාවර්තනයක් ලෙස මට හැඟේ.” **දිඹුලාගල මහා කාශ්‍යප, ධර්මකීර්ති වනරතන ශ්‍රී රාහුල, ශ්‍රී සුමංගලාදී පැරණි සිංහල පැවිදි පඬි පරපුරේ අන්තිම පුරුක සෝරත නාහිමියන් ලෙස මට සිතේ. උන්වහන්සේ ජංගම පුස්තකාලයකි.**

මේ සියල්ල ගැන සළකන කල්හි අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරතාභිධාන චරිතය යනු හෙළ-බොදු උරුමයේ විශිෂ්ඨතම සංකේතයක් වූ බව නිසැකය.

**විද්‍යොදය විශ්වවිද්‍යාලය ආරම්භ කිරීම හා ශ්‍රී සෝරත නාහිමිගේ දායකත්වය.**

අප කථානායක නාහිමි පාණන්වහන්සේ වෙත වගකීම් ගලා ආවේ නිතැතියෙනි.මල්වතු මහා විහාරය විසින් ගාලු කෝරළයේ ප්‍රධාන සංඝනායක ධුරයද ශ්‍රී සෝරත හිමියන්ට ප්‍රදානය කළ අතර 1936දී උන්වහන්සේ විද්‍යොදය පිරිවෙනේ උප ප්‍රධානාචාර්ය ධුරයටද 1958දී එහි ප්‍රධානාචාර්ය ධුරයටද පත්වූහ. 1936-1958 දක්වා විද්‍යොදය පිරිවෙනේ ප්‍රධානාචාර්ය ධුරය දැරූ බද්දේගම ශ්‍රී පියරතන නාහිමිපාණන් වහන්සේ අපවත්වීමට ටික කලකට පෙර සිට දුර්වල තත්ත්වයක පසුවූ බැවින් ප්‍රධානාචාර්ය ධුරයේ භාරදූර වැඩකටයුතු වැඩි ප්‍රමාණයක් ඉටුකිරීම ශ්‍රී සෝරත හිමිපාණන් වහන්සේට පැවරී තිබිණි. ඒ නිසා විද්‍යොදය පිරිවෙන විද්‍යොදය විශ්වවිද්‍යාලය බවට පත්කිරීමේ කාර්යභාරය මුළුමනින්ම පාහේ ශ්‍රී සෝරත ස්වාමීන් වහන්සේ වෙත පැවරී තිබිණි.

1945 සිට අධ්‍යාපන මාධ්‍යය ස්වභාෂාව බවට පත්කරනු ලැබූ අතර එය 1947 සිට ක්‍රියාවට නංවනු ලැබිනි.1956 මෙරට සිදුවූ දේශපාලන පෙරළියත් සමග සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කොට තිබිණි. එම අවධියේ මෙරට පැවතියේ එකම එක විශ්වවිද්‍යාලයක් පමණක් වූ අතර එය ලංකා විශ්වවිද්‍යාලය ලෙස හැඳින්විණි. එහි සියලු අධ්‍යාපන කටයුතු සිදුකරනු ලැබුවේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. ස්වභාෂා මාධ්‍යයන්ගෙන් මූලික අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව අති විශාල වූ අතර ඒ නිසා පාසල් අධ්‍යාපනය අවසන් කළ සිසුන්ට විශ්වවිද්‍යාලයට ඇතුල්වීමට තිබූ අධ්‍යාපන අවස්ථා ඉතා සීමිත විය. මෙම තත්ත්වය යටතේ සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලැබීමට ඉඩප්‍රස්ථා සැලසෙන නව විශ්වවිද්‍යාල ආරම්භ කිරීමේ ජාතික අවශ්‍යතාවක් උද්ගත වී තිබිණි. එම අවශ්‍යතාව සපුරාලීම සඳහා අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ රජය ක්‍රියාත්මක විය.

බණ්ඩාරනායක රජයේ අධ්‍යාපන ඇමතිවරයා වූ ඩබ්ලිව්. දහනායක මහතාගේ ඉල්ලීම පරිදි විද්‍යෝදය පිරිවෙන විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීම සඳහා වූ පණත් කෙටුම්පත සකස් කිරීමේ කාර්යභාරය ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේට පැවරුණි. විද්‍යෝදය පිරිවෙනේ ආචාර්ය මණ්ඩලයේ සේවය කළ පූජ්‍ය පලන්නොරුවේ විමලධම්ම හිමි, පූජ්‍ය බලගල්ලේ විමලබුද්ධි හිමියන විද්වත් භික්ෂූන් වහන්සේගේ සහ මහාචාර්ය සෙනරත් පරණවිතාන, ඩී. පී. ජයසේකර යන ගිහි විද්වතුන්ගේද සහාය ලැබගෙන උන්වහන්සේ "විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා පණවනු ලබන ආඥාවයි" නමැති කෙටුම්පත අධ්‍යාපන ඇමතිවරයාට භාරදුන්නහ. අළුතින් පිහිටුවීමට අපේක්ෂිත විශ්වවිද්‍යාලය සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු සිදුකෙරෙන බැවින් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ විවිධ ආයතන සහ තනතුරු හැඳින්වීමට ඒතාක් කල් භාවිත වූ බොහෝ ඉංග්‍රීසි යෙදුම් වෙනුවට නව සිංහල පාරිභාෂික පද රාශියක් ද පිරිවෙන් විශ්වවිද්‍යාලයට ගැලපෙන පරිදි පාඨමාලා කිහිපයක්ද පණත මගින් යෝජනා කෙරිණි. අවසානයේ දී විද්‍යෝදය විශ්වවිද්‍යාලය පිහිටුවීම සඳහා වූ සම්පූර්ණ සැලැස්ම අප කතානායක අතිපූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමිපාණන්ගේම නිර්මාණයක් විය.

විද්‍යෝදය සහ විද්‍යාලංකාර මහ පිරිවෙන් දෙක විශ්වවිද්‍යාල බවට පත්කිරීමේ පණත සම්මත කිරීමත් සමග වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියෝ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුරට පත්වීම ලදහ. පාලක සභාවේ සාමාජිකයින් මෙන්ම ආචාර්ය මණ්ඩලයට අවශ්‍ය ගුරු භවතුන්ද සෙසු නිලධාරීන්ද තෝරා ගැනීමෙන් පසුව 1959 පෙබරවාරි 19 වෙනි දින නව විශ්වවිද්‍යාලයේ වැඩකටයුතු ආරම්භ කෙරිණි. අප කතානායක හිමිපාණන්වහන්සේගේ බෞද්ධ විශ්වවිද්‍යාල පිළිබඳ පූර්ණ දර්ශනය ක්‍රියාවට නංවන්නට යුහුසුළු වූයේ එතැන් පටන්ය.

පැරණි පිරිවෙන් විශ්වවිද්‍යාලවල ප්‍රධාන විෂයයන් වූ පාලි, සිංහල සහ සංස්කෘත භාෂාවලට මෙන්ම බෞද්ධ අධ්‍යයනයට ප්‍රධාන තැනක් ලබාදීම නව විශ්වවිද්‍යාලයේ අරමුණ බව පැහැදිලි කළ ශ්‍රී සෝරත නාහිමියෝ කාලීන ජාතික අවශ්‍යතා සැළකිල්ලට ගෙන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයයේ එතෙක් නොතිබුණු පාඨමාලා කිහිපයක්ද ආරම්භ කළහ.

එවක් පටන් විශ්වවිද්‍යාලයේ භෞතික සම්පත් වැඩිදියුණු කොට විශ්වවිද්‍යාලයකට අත්‍යාවශ්‍ය පුස්තකාලයක් ඉදිකොට ශිෂ්‍ය සංඛ්‍යාව පුළුල් වෙත්ම ඔවුන්ට කාලීන පාඨමාලා ඉගෙනීමට අවශ්‍ය පහසුකම් සැළසීමට උපකුලපති සෝරත ස්වාමීන් වහන්සේ පියවර ගත්හ.

නව විශ්වවිද්‍යාලය ආරම්භ කළේ මාලිගාකන්දේ තිබූ පිරිවෙන් භූමිය තුළ එම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමෙනි. එහෙත් එහි විශ්වවිද්‍යාලය පවත්වා ගැනීම බෙහෙවින් අසීරු තත්ත්වයක් පැවතියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසාය. ඊටත් අමතරව ශ්‍රී සෝරත ස්වාමීන් වහන්සේට මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනද ආරක්ෂාකර ගැනීමේ අභිලාෂයක් තිබිණි. මෙම කරුණු හේතුකොට නව විශ්වවිද්‍යාලය විද්‍යෝදය පිරිවෙන් භූමියෙන් බැහැරට ගෙනයාම සඳහා ඊට සුදුසු තරම් ඉඩකඩ ඇති භූමියක් තෝරාගැනීමට උන්වහන්සේට අවශ්‍ය විය.

කෝට්ටේ රාජධානි අවධියේ මුළු සිරිලක එක්සේසත් කළ 06 වෙනි පරාක්‍රමබාහු රජු සිය මව්බිසවට පිං පිණිස ඉදිකරන ලද සුනේත්‍රාදේවී පිරිවෙනට විශාල ඉඩම් ප්‍රමාණයක් ප්‍රදානය කර තිබිණි. ජනාකීර්ණ තදබදයෙන් යුක්ත කොළඹ නගරයෙන් බැහැර නිසංසල ප්‍රදේශයක පිහිටි සුනේත්‍රාදේවී පිරිවෙන සතුව පැවති ඉඩමක් විශ්වවිද්‍යාල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලබාගැනීමට ශ්‍රී සෝරත හිමිපාණන් වහන්සේ එම පිරිවෙනේ අධිපති පූජ්‍ය මැදගොඩ සුමනතිස්ස ස්වාමීන් වහන්සේ සමග සාකච්ඡා කළහ. නුගේගොඩ විජේරාම මංසන්ධියට නුදුරු ගංගොඩවිල ග්‍රාමයෙහි පිහිටි වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ගොඩනැගිලි ඉදිකොට ඇති භූමි භාගය ලබාදීමට එවක විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක්ද වූ පූජ්‍ය මැදගොඩ සුමනතිස්ස ස්වාමීන් වහන්සේ මහත් පරහිතකාමීත්වයෙන් කැමැත්ත පලකළහ.

1959 ජූලි 20 වෙනි දින ගංගොඩවිල ග්‍රාමයේ ඉඩම් අක්කර 25 ක් ලබාගත් ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේ එහි ගොඩනැගිලි පෙරදිග ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ඉදිකිරීමේ අපේක්ෂාවෙන් තව පිරිසක් සමග ඉන්දියාවේ කල්කටා විශ්වවිද්‍යාලයට ගොස් එහි ගොඩනැගිලිද අධ්‍යයනය කොට විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ කළහ. විශ්වවිද්‍යාල භූමියෙහි ඉදිකෙරෙන ප්‍රධාන ගොඩනැගිල්ල වන ශ්‍රී සුමංගල මන්දිරය, රතනසාර සහ ඥානේස්වර ශාලා දෙක සියලු පහසුකම්වලින් යුක්ත පුස්තකාලය අගමැති බණ්ඩාරනායක නමින් නම් කොට ඇති උපාධි ප්‍රධානෝත්සව ශාලාව, විනේතෲ නිවාස තුන සහ නේවාසිකාගාර යන ප්‍රධාන ගොඩනැගිලි ඉදිකිරීමෙන් පසුව විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ නව ගොඩනැගිල්ලට පිවිසීමේ උත්සවය 1961 නොවැම්බර් මස 22 වෙනි දින ලොව ප්‍රථම අගමැතිවරිය ලෙස විශ්ව ගෞරවයට පත් අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ විෂය ධාරාවට ආයුර්වේදය, ජ්‍යොතිර්විද්‍යාව, පුරාවිද්‍යාව පමණක් නොව එකල ලංකා විශ්වවිද්‍යාලයේවත් නොතිබුණු කළමණාකරන විෂයද ඇතුළත් කරන ලදී. මෙය බෞද්ධ විශ්වවිද්‍යාලයක් වූ නමුත් එය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් වීම සඳහා විද්‍යා විෂය ධාරාවක් තිබීමද අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස සැළකූ ශ්‍රී සෝරත නාහිමිපාණන් වහන්සේ 1961දී විද්‍යා විෂය ක්ෂේත්‍රයද හඳුන්වා දුන්හ.

මෙම විශ්වවිද්‍යාල පරිසරය අතින් ද පහසුකම් සැලසීමෙන්ද නවීනතම විෂය කෙෂ්ත්‍ර හඳුන්වාදීමෙන් ද පහසුකම් සැලසීමෙන් ද ශ්‍රී සෝරත මාහිමිපාණන් වහන්සේ විසින් නව විශ්වවිද්‍යාලවලින් බිහිකිරීමට බලාපොරොත්තු වූ ශිෂ්‍යයන්ගේ ගුණ නුවන පිළිබඳව ඉතා දීර්ඝ විස්තරයක් ප්‍රකාශයට පත්කර හැරියේය. අතිශය වැදගත් දර්ශනයක් අඩංගු එහි හරය පහත සඳහන් පරිදි දැක්විය හැකිය.

**"උගතුන් මිස උපාධිධාරීන් බෝකිරීමට කිසිවිටෙක අපේ අදහසක් නැත්තේය. මේ විශ්වවිද්‍යාලය උපාධි විකුණන හෝ උපාධි තනන සාප්පුවක් නොහොත් කම්හලක් කරන්නට සැරසෙතොත් අප කරන්නේ විශ්වවිද්‍යාලයට පමණක් නොව රටටද කිව නොහැකි තරමේ මහත් අනර්ථයකි. අපේ උපාධිධාරීන් උපාධියට ගැලපෙන උගත්කමින් තොරවූ බව එළිවුවහොත් අපේ විශ්වවිද්‍යාල උපාධි විකුණන සාප්පුවක් සේ රටවැසියා විසින් සලකනු නියතය. එබැවින් උපාධි තත්ත්වය හා පර්යේෂණ තත්ත්වය පහත හෙළා විද්‍යොදය විශ්වවිද්‍යාලය අගෞරවයට භාජනය නොකිරීමට" විශ්වවිද්‍යාලයටඅයත් සියලු කොටස් තරයේ සිත්හි තබාගැනීම වැදගත්ය."** යනුවෙන් උන්වහන්සේ විශ්වවිද්‍යාල ගතයුතු මඟ පැහැදිළිව පෙන්වා දුන්හ.

මෙහිදී අවධාරණය කළ යුත්තේ අතිපූජ්‍ය වැලිවිටියේ සෝරත නාහිමිපාණන්ට අවශ්‍ය වූයේ තවත් එක් විශ්වවිද්‍යාලයක් නොව අපේ උරුමය තුළ අපට හිමි කොට දී ඇති සැබෑ මිනිසුන් සැබෑ උගතුන් බිහිකරණ විද්‍යාස්ථානයක් බව විද්‍යාමාන කළා පමණක් නොව ඒ සඳහා අවශ්‍ය මඟද එළිදරව් කොට දුන්නේ බටහිරකරණයට ගොදුරු වූ පිරිස් අතින් එය කවදාවත් ඉටු නොවනු ඇතැයි සැළකූ නිසාම වියයුතුය. එහෙයින් මෙම උත්තමයානන් වහන්සේ සමරණ අවස්ථාවේදී අප හැමට උන්වහන්සේ වෙත ඉහළම ගෞරවය දැක්විය හැක්කේ මෙම විශ්ව විද්‍යාලය උන්වහන්සේ අපේක්ෂා කරන ලද ඉලක්ක කරා ගෙන යාමට ඇපකැපවීමෙන් බව අවධාරණය කරනු කැමැත්තෙමි.

මේ අන්දමින් අසීමිත ලෙස සමාජය හා සියලු සත්ත්වයා වෙත සම සිතින් සියලු ආකාරයෙන් සදානුස්මරණීය සේවාවක් ඉටුකළ බෝධිසත්ව ගුණෝපේත වූ අතිපූජ්‍ය වැලිවිටියේ සෝරතාභිධාන මහානාහිමිපාණන් වහන්සේ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අතිඋතුම් නිර්මල සර්වකාලීන සත්‍ය ධර්මය සනාථ කරමින් 1963 ජුලි මස 17 වෙනි දින අපවත් වී වදාළේ දෙස් විදෙස් හැම තැන්හිම උගත්බව වියත්බව වැදගත්බව සුපේෂල ශික්ෂාකාමීබව ආදර්ශමත්බව ආදී සියලු උදාර ගුණාංග අගේ කළ සියලු දෙනාගේම සෝ සුසුම් මැද බව සඳහන් කරන්නේ උන්වහන්සේ වෙත ගෞරවය දැක්වීමට එක්වන සියලු දෙනාගේ පරම අධිෂ්ඨානය විය යුත්තේ අපේ හුස්මෙන් පවා සමාජයට හා සියලු සතවෙතට පිහිටක් යහපතක් සිදුකළ යුතුය යන ශ්‍රේෂ්ඨ සිතුවිල්ල හදවත රඳවා ගැනීමෙන් බව අවධාරණය කරමිනි.

මහාචාර්ය මාලනී ඇඳගම

2015 .07 .17